සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | පැය / மணித்தியாலம் / Hours |
|---|---|---|---|
| 13 | බෞද්ධ ශිෂ්ටාචාරය I | I | 2 |

**උපදෙස්:**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර යටින් ඉරි අඳින්න.

01. බ්‍රාහ්මණයන් වර්ණ පදනම් කොට ගෙන සමාජය කොටස් හතරකට බෙදයි. ඒ වර්ග කිරීම නිර්මාණවාදී බෙදීමක් ලෙස සඳහන් කර තිබේ. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තය මගින් ද ඒ බව කියවේ. එම තොරතුරුවලට අනුව බ්‍රාහ්මණයින් විසින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍ය හා ශුද්‍ර වශයෙන් සංස්ථාවන් හතරකට මුලු මහත් භාරතීය සමාජය ම බෙදා ඇත. එම බෙදීම ඔවුන් විසින් සිදුකරන ලද්දේ.

1) සමාජය පදනම් කොට ගෙනය
2) ශරීරය පදනම් කොට ගෙනය
3) පරිසරය පදනම් කොට ගෙනය
4) ගුණ ධර්ම භේදය පදනම් කොට ගෙනය
5) උස් පහත් භේදය පදනම් කොට ගෙනය

02. වෛදික සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් ආකාරයට බ්‍රාහ්මණ වර්ණයට අයත් **නොවන** ස්වධර්ම ඇතුළත් වර්ණය වනුයේ මෙයින් කුමණ වර්ණයෙහිද?

1. අධ්‍යාපනය, යාග කිරීම, යාග කරවීම
2. අධ්‍යාපනය, දන්දීම, රාජ්‍යානුශාසනය
3. අධ්‍යාපනය, අධ්‍යයනය, යාග කිරීම
4. අධ්‍යාපනය, යාග කිරීම,කෘෂිකර්මාන්තය
5. අධ්‍යාපනය, යාග කරවීම, රාජ්‍යානුශාසනය

03. බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් කාන්තාව විවිධ වු නීති රීති වලට යටත් කොට පාලනය කරන ලදි. ඇය සිය ජීවිත කාලය පුරාවට ස්වාමියාට පති භක්තියෙන් යුතුව චාරිත්‍ර වාරිත්‍ර ද ඉටුකළ යුතු ය. ඒ අනුව බිරිද තම ස්වාමියා වෙනුවෙන් ඉටුකළ යුතු උසස්ම චාරිත්‍රය වන්නේ.

1. ස්වාමියාගේ දෙමවුපියන් හොඳින් රැකබලා ගැනීමයි.
2. දරුවන්ගේ හා නිවසේ කටයුතු සියල්ල මැනවින් ඉටු කිරීමයි.
3. ස්වාමි පුරුෂයාට නො අඩුව සිය සිතැඟි ඉටු කර ගැනීමට ඉඩ දීමයි.
4. ස්වාමි පුරුෂයා මියගිය පසු වැඩිමහල් පුත්‍ර යටතේ විවාහක ජීවිතයක් ගත කිරීමයි.
5. ස්වාමි පුරුෂයා මළ පසු සති පූජාව පැවැත්වීමයි.

04. බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරයකු වූ පූර්ණකස්සපගේ ප්‍රධාන ඉගැන්වීම වන්නේ.

1. උච්ඡේද භෞතිකවාදයයි 2. පරම අවිහිංසාවාදයයි 3. අමරා වික්ඛේපවාදයයි
4. අකිරියවාදයයි 5. නියති පරිණාමවාදයයි

05. බුද්ධකාලීන භාරත්යේ පැවැති සොළොස් මහා ජනපද අතුරෙන් රාජාණ්ඩු ප්‍රතිපත්ති ක්‍රියාත්මක **නොවුන** ජනපදය ලෙස සැලකෙන්නේ

1. මගධ ජනපදයයි 2. කෝසල ජනපදයයි 3. වත්ස ජනපදයයි
4. අවන්ති ජනපදයයි 5. වජ්ජි ජනපදයයි

06. භාරතය තුළ වාණිජකරණය ජාත්‍යන්තර වශයෙන් දියුණු තත්ත්වයකට පත්ව තිබුණු බවට දැක්විය හැකි සාධකය වන්නේ.

1. භාණ්ඩ නිෂ්පාදනය කිරීම ඉහළ යෑමයි. 2. නගර නිර්මාණය වීමයි.
3. සේද මාවත් ඔස්සේ කළ වෙළදාමයි. 4. ගංගා මිටියාවත් ඔස්සේ භාණ්ඩ වෙළදාමයි
5. කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂණය වීමයි.

07. දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද, බුදු රජාණන් වහන්සේ සුවිශේෂ නාමයකින් හඳුන්වන බව නව අරහාදි බුදුගුණ විවරණයෙන් පැහැදිලි වේ. එම බුදුගුණය හැඳින්වෙන්නේ.

1. ලෝකවිදූ නමිනි. 2. අරහං නමිනි. 3. සත්ථාදේවමනුස්සානං නමිනි.
4. භගවා නමිනි. 5. සම්මාසම්බුද්ධ නමිනි.

08. "මිනිස් වර්ගයාගේ වැඩි ම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් ම වෙන් කොට දැක්විය හැක්කේ බුදු රජාණන් වහන්සේ ය." බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීමක් වන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

1. මහාචාර්ය ලක්ෂ්මී නරසු. 2. ඇල්බට් අයින්ස්ටයින් 3. බර්ට්‍රන්ඩ් රසල්
4. මහාචාර්ය සෝණ්ඩර්ස්. 5. එඩ්වින් ආර්නෝල්ඩ්

09. මගධය වේභාර,වේපුල්ල,ගිජ්ඣකූට,ඉසිගිලි,පාණ්ඩව යන පර්වත පහකින්ම වට වී පිහිටා ඇති මහා රාජ්‍යයකි. මුල්කාලීනව මෙහි පාලකයා බිම්බිසාර රජුවේ. ඒ අනුව පර්වත පහකින් වට වූ නිසා මෙම රාජ්‍ය හඳුන්වනු ලැබුවේ.

1) ගිරිබ්බජ නමින් ය 2) ගිරිපර්වත නමින් ය 3) පඤ්ච පර්වත නමින් ය
4) මහාමේරු පර්වත නමින් ය 5) පඤ්චකූට පබ්බත නමින් ය

10. බුදුන්වහන්සේ විවිධ වූ දක්ෂතා හැකියා ඇති මහතෙරුන්ට මෙන්ම තෙරණිවරුන්ට ද තනතුරු පිරිනමන ලදි. ඒ අතරින් පැරණි භික්ෂුණීන් අතර අග්‍ර පදවිය ප්‍රධානය කරනු ලැබුවේ.

1. ඛේමා තෙරණිය ට. 2. මහා ප්‍රජාපතීගෝතමී තෙරණියට.
3. සෝමා තෙරණිය ට. 4. සකුලා තෙරුණියට. 5.භද්දකච්චායනා තෙරණියට

11. බුදුදහමට අනුව යම් පුද්ගලයෙක් උපාසකයෙකු බවට පත්වන්නට නම් තිසරණ සහිත වූ පන්චසීලය සමාදන්ව ආරක්ෂා කළ යුතුවේ. ධර්මය ශ්‍රවනය කළ යුතුය. දාන, සීල, භාවනා යන ත්‍රිවිධ කුසලයන්තුළ නොපැකිළිව කටයුතු කළ යුතුවේ. ඒ අනුව බුද්ධ කාලින උපාසකවරුන් අතර බුද්ධ යන නාමය ශ්‍රවනය කිරීමත් සමඟ බුදුන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගත් උපාසකතුමා වන්නේ.

1. චිත්ත ගහපති තුමා ය. 2. අනාථපිණ්ඩික තුමාය. 3. නකුල පිතාය.
4. ධනංජය සිටුතුමාය 5. උපාලි ගෘහපතියාය.

12. පුද්ගලාබද්ධ කර්මයන්ගේ අයිතිය කරන්නාට හිමි වන බව බුදු දහම මගින් උගන්වන අතර බමුණු දහම සියලු කර්මයන්ගේ අයිතිය අදෘශ්‍යමාන බලකයට පවරා ඇත. විශ්වයේ ආරම්භය, සත්වයාගේ ඇවැත්ම පැවැත්ම සර්වබලධාරී දෙවියකුට පවරා ඇති අයුරු බමුණු දර්ශනයන්ගේ ඉගැන්වීම් මගින් දක්නට ලැබුණි. එම ඉගැන්වීම් හේතුවෙන් පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව අහිමි වේ. එහි එන ස්වාමිත්වයෙන් අදහස් කරන්නේ.

1. තමාට තමා හැර වෙනත් අයෙකු නැතිබවය
2. නිදහස්ව සිය කැමැත්ත පරිදි කටයුතු කළ හැකි බවය
3. සිය කැමැත්තට අනුව හොඳ නරක තමා විසින්ම තීරණය කිරීමය
4. තමාත් අණුනුත් එක හා සමාන බවය
5. තමා තමාට අවංක විය යුතු බවය

13. සමාජ ප්‍රභවය පිළිබඳ විවිධ අදහස් භාරතයේ පැවති දර්ශනවාදවලින් උගන්වා ඇත. නිර්මාණ වාදී ඉගැන්වීම් ඒ අතර දක්නට ලැබුණි. එහෙත් සමාජ ප්‍රභවය සිදු වී ඇත්තේ කිසිවකුගේ හෝ මැවීමක් පදනම් කොට ගෙන නොවන බව බුදුදහම අවධාරණය කර ඇත. ඒ සඳහා භාවිතා කළ ඉගැන්වීම වුයේ.

1. ත්‍රිලක්ෂණවාදය යි. 2. හේතුඵලවාදයයි. 3.නියාමධර්ම සංකල්පයයි.
4. චතුරාර්ය සත්‍යයයි. 5. භාවනා සංකල්පයයි.

14. බෞද්ධ දේශපාලන දර්ශනයට අනුව රටේ රජතුමා විසින් තම රාජ්‍ය තුළ සිටින වෙළඳාමේ නිරත වන පිරිස් හඳුනාගෙන ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතුවල අභිවෘද්ධිය උදෙසා අවශ්‍ය මූල්‍ය ධනය සපයා දීම, රජයට සේවය කරන පිරිස් වෙනුවෙන් ආහාරපාන හා වටුප් ලබා දීම, යනුවෙන් දැක්වෙන පරිදි රට තුළ රැකියා අවස්ථා සැලසුම් කිරීම තුළින් රටේ දිළිඳුකම තුරන් කර ගත හැකි බව සඳහන් රාජ ධර්මය වන්නේ.

1. අවිහිංසාව යි 2. අක්‍රෝධය යි 3. දානය යි 4. අවිරෝධතාවය යි
5. සීලය යි

15. දස සක්විතිවත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතට ඇතුළත් **නොවන** ලක්ෂණය වන්නේ.

1. අන්තඃපුර ජනයා කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
2. බල සේනාව කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
3. බ්‍රාහ්මණ ගෘහපතීන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
4. විවාහක අවිවාහක ස්ත්‍රීන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
5. ශ්‍රමණ බ්‍රහ්මණයන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.

16. සිත,කය,වචනය යන තිදොරින් සිදුවන නිරවද්‍ය ක්‍රියා දහයක් ඇති බවත්, ඒවා දස කුසල් නමින් හැඳින්වෙන බවත් බුදුදහමේ දැක්වේ. මෙම කුසල දහය සිදු වන්නේ.

1. කයින් තුනක් ද වචනයෙන් තුනක් ද මනසින් හතරක් වශයෙනි.
2. කයින් හතරක් ද වචනයෙන් තුනක් ද මනසින් තුනක් වශයෙනි.
3. කයින් තුනක් ද වචනයෙන් හතරක් ද මනසින් දෙකක් වශයෙනි.
4. කයින් හතරක් ද,වචනයෙන් හතරක් ද, මනසින් දෙකක් වශයෙනි.
5. කයින් හතරක් ද, වචනයෙන් දෙකක් ද, මනසින් හතරක් වශයෙනි.

17. දස පුණ්‍ය ක්‍රියාවල ඇතුළත් පිං අනුමෝදන් කිරීම............................ යනුවෙන් හඳින්වේ.

1. වෙය්‍යාවච්ච 2. අපචායන 3. පත්තිදාන 4. උපට්ඨාන 5. පත්තානුමෝදනා

18. දස අකුසලයෙන් මිදීම දස කුසලයයි. ඒ අනුව දස කුසලයට අයත් වන්නේ.

1. ප්‍රාණඝාතයෙන් වැළකීම. 2. සොරකම් කිරීම 3. කාමයේ හැසිරීම 4. බොරු කීම
5. කේලාම් කීම

19. විනය ශික්ෂාවන්ට අනුව භික්ෂූන්ට නිල් තණ පිට්ටනිවල මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම, ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම තහනම් විය. එසේම සියලුම ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්තියක් විය. මේ ඉගැන්වීම් තුළින් ප්‍රකාශ වන්නේ.

1. භික්ෂූන්ට බුදුන්වහන්සේ පරිසරය සම්බන්ධව විනයනීති පනවන ආකාරයයි
2. පරිසරය සංරක්ෂනයේ දී භික්ෂුවගේ දායකත්වයයි.
3. රජයේ ප්‍රතිපත්ති භික්ෂුව රැකියයුතු බවයි.
4. පරිසරය විනාෂයෙන් රෝගාදිය ඇති වන බවයි.
5. ජලයට මුත්‍රා කිරීම නිසා ජලය අපිරිසිදුවන බවයි.

20. සෞන්දර්ය රසාස්වාදය බුදුදහම තුළ අවතක්සේරු කොට නොමැත. බුදුරදුන් පවා ඇතැම් අවස්ථාවන්හිදී විරාගී රස වින්දනය අගය කොට ඇත. එලෙස බුදුරදුන් සෞන්දර්ය අගය කළ අවස්ථාවක් දැක්වෙන මූලාශ්‍රයක් වන්නේ.

1. ඒතදග්ග පාලියයි 2. ථෙර ථෙරී ගාථා ආදියයි 3. සක්කපඤ්ඤ සූත්‍රයයි
4. වනරෝපම සූත්‍රයයි 5. චක්කවත්තිසීහනාද සූත්‍රයයි.

21. ධනය පසුපස යාමත්, ධන සම්පත් ජීවිතයේ නිෂ්ඨාව ලෙස නොසැලකීමත්, සම්පත් ගොඩගසා නොගෙන පරිහරණයට ඉඩ හැරීමත් කළ යුතු බව බුද්ධ දේශනාවයි. ඒ අනුව සම්පත් පරිහරණයේ දී අනුගමනය කල යුතු ක්‍රමවේදය සඳහන් වන බෞද්ධ ඉගැන්වීම වන්නේ.

1. පංචබලි සංකල්පයයි. 2. කර්ම සංකල්පයයි. 3. චතුර්විධ සැප සංකල්පයයි.
4. චතුර්විධ සංකල්පයයි. 5. සම්මා ආජීවයයි.

22. ධනය ඉපැයීමේ දී ශ්‍රමය වැය කිරීම අනිවාර්ය බැවින් අනලස්ව, උත්සාහයෙන් හා වීර්යයෙන් ක්‍රියා කළ යුතුය. පුද්ගලයා තම ශ්‍රමය උත්සාහය යොදා පවත්වාගත යුතු අවස්ථා කිහිපයක් පෙන්වා දෙන බුදුදහම ආරම්භ කරන ලද කාර්යය නොනවත්වා ඉදිරියට පවත්වාගෙන යෑම හඳුන්වන්නේ.

1. ආරම්භක ධාතු ලෙසය 2. නික්ඛම ධාතු ලෙසය 3. පරක්කම ධාතු ලෙසය
4. ථාම ධාතු ලෙසය 5. ඨිති ධාතු ලෙසය

23. බුදුදහමට අනුව නොකළයුතු වෙළදාම් මෙන්ම තුලාකූට, කංසකූට, මානකූට, උක්කෝටන, නිකති ආදී විවිධ වාංචනික කටයුතුවලින් මුදල් ඉපයීම නොකළ යුතු යැයි දේශනා කොට ඇත. එයින් උක්කෝටන ලෙස හඳුන්වන්නේ.

1. හොර තරාදිවලින් කරන මැනීම 2. රැවටීම් මගින් කරන වැඩ
3. හොර පඩිවලින් කරන මැනීම 4. හොරට මැනීමෙන් කරන වැඩ
5. අල්ලස් ගැනීමෙන් කරන මැනීම්

24. ආර්ය විනයෙහි දකුණු දිශාවට නමස්කාර කිරීම යනුවෙන් හඳුන්වා ඇත්තේ.......................විෂයෙහි යුතුකම් හා ගකිම් ඉටු කිරීමයි.

1. දෙමාපියන් 2. අඹු-දරුවන් 3. යහළු මිත්‍රයන් 4. ගුරුවරුන්

5. සේවක-සේවිකාවන්

25. පුද්ගලයකුගේ මෙලොව වශයෙන් දියුණුවක් ඇති කර ගැනීමට වැදගත් සූත්‍ර දේශනාවක් වශයෙන් මංගල කරුණු දේශනා කොට ඇත. එහි ඇතුළත් කරුණු සංඛ්‍යාව වුයේ.

1. විසිහතර කි. 2. විසිපහ කි. 3. විසිහයකි. 4. විසිහතකි. 5 .විසිඅටකි

26. ධනය, තනතුරු ආදිය පිළිබඳ මානයෙන් තද වී ස්වකීය ඥාතීන් පහත් කොට සැළකීම මූලාශ්‍රයාගත තොරතුරුවලට අනුව පුද්ගලයා

1. භෝග විනාශ කරන්නෙක් වෙයි. 2. තෘෂ්ණාවෙන් පෙළෙන්නෙක් වෙයි.

3. පසුතැවීමට පත් වෙයි. 4. පරිහීමට පත්වෙයි.

5. නිදි වර්ජිතව කටයුතු කරන්නෙක් වෙයි.

27. "අක්කෝධේන ජිනේ කෝධං-අසාධුං සාධුනා ජිනේ

ජිනේ කදරියං දානේන-සච්චේන අලිකවාදිනං'

ඉහත ගාථාවට අනුව ක්‍රෝධ කරන්නා ඒකාන්තයෙන්ම දිනිය යුතු වන්නේ

1. මෛත්‍රී කිරීමෙන් ය. 2. සත්පුරුෂ කමින්ය. 3. දන් දීමෙන් ය.

4. සත්‍ය කතා කිරීමෙන් ය. 5. බණ ඇසීමෙන් ය.

28. බුද්ධත්වයෙන් පසු තමා විසින් අවබෝධ කොටගත් ධර්මය ලෝකයාට දේශනා කිරීමේ අපේක්ෂාවෙන් බරණැස ඉසිපතනාරාමයට වැඩම කළ බුදුන් වහන්සේ ප්‍රථම රහත් හැටනම ධර්ම ප්‍රචාරයේ යොදවා උන්වහන්සේ ද ධර්ම ප්‍රචාරයේ යෙදුනසේක. එහිදි දෙවන ධර්ම දූත කණ්ඩායම ද ධර්ම ප්‍රචාරයේ යෙදවීමට බුදුන් වහන්සේට හැකියාව ලැබී ඇත. ඒ අනුව සසුනට එක් වු දෙවන කණ්ඩායම වන්නේ.

1. යසකුල පුත්‍රයා ඇතුලු කණ්ඩායමයි. 2. පස්වග මහණුන් ය.

3. භද්දවග්ගිය කුමාරවරුන් ය. 4. තුන් බෑ ජටිලයින් ය.

5. කාළුදායි ඇතුලු පිරිසයි.

29. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් යෑමට මත්තෙන් ශාසනයේ ඇති වු අධර්මාදී ක්‍රියාවන් හේතුවෙන් මහ තෙරුන් විසින් සංගායනාවක් පැවැත් වීමට තීරණය කර ඇත. එසේ ගන්නා ලද තීරණයට අනුව පළමු සංගායනාව පැවැත්වීමට සියලු කටයුතු මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සූදානම් කළ අතර එහි දී මුලින්ම සංගායනා කිරීමට තීරණය කරන ලද්දේ.

1. සුභද්‍ර තෙරුන්ගේ ප්‍රකාශනය සාකච්ඡා කිරීමයි

2. ධර්මය පිළිබඳ ආනන්ද හිමිගෙන් ප්‍රශ්න කිරීමයි.

3. විනය පිළිබඳ උපාලි තෙරුන්ගෙන් විමසීමයි.

4. ආනන්ද හිමිට නැගුණ චෝදනාවන්ගෙන් උන්වහන්සේ නිදහස් කිරීමයි.

5. කුඩා අනුකුඩා ශික්ෂා පද පිළිබඳවයි.

30. දෙවන ධර්ම සංගායනාව සඳහා ප්‍රධාන වුයේ වජ්ජි පුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දස වස්තුව වේ. එහි එන **ආවාස කප්ප** ලෙස සඳහන් වන්නේ.

1. අඟක ලුණු තබාගෙන භාවිතය කැප ය.
2. දෑගුලක් ඉර අවරට ගිය කල වැළඳීම කැප ය.
3. එකම ආවාසයක පිරිස වෙන වෙනම විනය කර්ම කිරීම කැපය.
4. කිරිත්, දීකිරිත් නොවු මැද මට්ටමේ කිරි වැළඳීම කැපය.
5. නොපැසුණු සුරා පානය කිරීම කැපය.

31. දස වස්තුව විනිශ්චය කිරීමට මුලින් ම උබ්බාහිකාවක් පත් කළ අතර එහි දී පෙරදිගින් හා බටහිර දිසාවෙන් භික්ෂූන් හතර නම බැගින් අටනමක් වැඩමවන ලදි. එයින් පෙරදිගින් වැඩමවන ලද්දේ.

1. සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, වාසභගාමී යන හිමිවරුන් ය.
2. රේවත, සානවාසීසාම්භූත, කාකණ්ඩපුත්‍ර යස, සුමන යන හිමිවරුන් ය.
3. සබ්බකාමී, සානවාසීසාම්භූත, වාසභගාමී, සුමන යන හිමිවරුන් ය.
4. රේවත, සාළ්හ, ඛුජ්ජසෝභිත, සබ්බකාමී යන හිමිවරුන් ය.
5. සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, රේවත යන හිමිවරුන් ය.

32. භාරතයේ පැවති බෞද්ධ විශ්වවිද්‍යාල අතරින් **අතීස හිමියන්ගේ** ප්‍රධානත්වයෙන් සියලු කටයුතු සිදු වු විශ්වවිද්‍යාලය වුයේ.

1. නාලන්දා විශ්වවිද්‍යාලයයි.
2. වික්‍රමශිලා විශ්විද්‍යාලයයි
3. වලභි විශ්වවිද්‍යාලයයි
4. සෝමපුර විශ්වවිද්‍යාලයයි.
5. ජගන්දලා විශ්වවිද්‍යාලයයි.

33. භාරතයේ පහළ වු අසහාය බෞද්ධ පාලකයෙකු බවට අශෝක රජු පසුකාලයේ දී පත් වී ඇත. එතුමා බෞද්ධ ප්‍රබෝදය වෙනුනේ විශාල සේවයක් සිදු කරන ලදි. සංඝ සාමග්‍රියක් ඇති කිරීම, සංගායනාවක් පැවැත්වීම මෙන්ම වෙහෙර විහාරද ඉදි කර තිබේ. මෙම සියලු සත්කාර්යයන් ඉටු කළ අසෝක රජු බෞද්ධයකු බවට පත් වන්නේ.

1. නිග්‍රෝධ සාමණේරයානන් වහන්සේ මගින් ය.
2. මොග්ගලිපුත්ත තිස්ස හිමියන් මගින් ය.
3. මහාකාශ්‍යප හිමියන් මගින් ය.
4. සැරියුත් හිමියන් මගින් ය.
5. ආනන්ද හිමියන් මගින් ය.

34. පණ්ඩුකාභය රජු යක්ෂයින්ට විවිධ ස්ථානවල වාසස්ථාන ඉදිකර දෙන ලදි. ඒ අනුව කාලවේල යක්ෂයාට දෙවොලක් ඉදි කර දෙන ලද්දේ.

1. අභය වැවේ යටි කොනෙන් ය.
2. රජ මැදුර ආසන්නයේ ය.
3. නුවරින් නැගෙනහිර දිසාවෙන් ය.
4. කලා වැව ආසන්නයේ ය.
5. තිසා වැවේ උඩ කොනින් ය.

35. මෙලොව දී යම් පවුලකට කුලයකට හිතවත්ව සිටිය අය මියගිය පසු යක්ෂ ආත්මවල ඉපදී පෙර ආත්මයේ නෑදෑ හිතමිතුරන් රැකබලාගන්නේ යැයි විශ්වාසයෙන් ඔවුන් මළවුන් ඇදහීමක් සිදු කරන ලදි. එම ක්‍රමය බුදු දහම ලැබීමෙන් පසුව

1. වෘක්ෂ වන්දනාවට ආදේශ විය.
2. දේව වන්දනාවට අදේශ විය.
3. ස්තූප වන්දනාවට අදේශ විය.
4. මළවුන්ට පින්දීමට ආදේශ විය.
5. ප්‍රතිමාවන්දනයට ආදේශ විය.

36. බුදුදහම පැමිණෙන්නට පෙර ලක්දිව බොහෝ ආගමික ඇදහිලි හා විශ්වාස පැවතිණ. එම ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහ දැක් වූ රජෙකු ලෙස පණ්ඩුකාභය රජු හඳුනාගත හැකිය. රජු ආගමික කටයුතු ඉටු කිරීමට පහසුකම් සපයා දීමක් ලෙස 'සොත්ථි ශාලා' නම් ගොඩනැගිලි විශේෂයක් කරවා දුන් බව මහා වංශයේ සඳහන් වේ. එම ගොඩනැගිලි විශේෂය තනවා දෙන ලද්දේ.

1. බ්‍රාහ්මණයින් උදෙසාය. 2. පරිබ්‍රාජකයින් උදෙසා ය 3. නිගණ්ටයින් උදෙසා ය
4. ආජීවකයන් උදෙසා ය. 5. තාපසයන් උදෙසා ය.

37. ශ්‍රී ලංකාවේ ඉපැරණි බෞද්ධ මධ්‍යස්ථාන මගින් ඉටු වූ ශාසනික කාර්යභාරය අතිමහත් ය. ඒ අනුව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, පාලි අටුවා රචනා කිරීම, විනය සංගායනාවක් පැවැත් වීම ආදී ධර්ම ශාස්ත්‍රීය සේවාවන් ඉටු කරන ලද්දේ.

1. අභයගිරි විහාරයේ මූලිකත්වයෙන් ය.
2. මහා විහාරයේ මූලිකත්වයෙන් ය.
3. ජේතවන විහාරයේ මූලිකත්වයෙන් ය.
4. චේතිගිරි විහරයේ මූලිකත්වයෙන් ය.
5. වෙස්සගිරි විහාරයේ මූලිකත්වයෙන් ය.

38. ලාංකේය රාෂ්ට්‍ර පාලනපයට බුදුදහමේ ආභාෂය ලැබී ඇති ආකරය විවිධ සාධකයන්ගෙන් හඳුනාගත හැකිය. ඒ අතර වැදගත් ලක්ෂණයක් වන්නේ ලාංකේය පාලකයින්ට අනුශාසනා කිරීමට භික්ෂූන් මූලික වීම යි එහි දී දුටුගැමුණු රජුට අනුශාසනා කරන ලද්දේ.

1. මිහිඳු මහ රහතන් වහන්සේ ය.
2. ගෝධගත්තතිස්ස හිමියන් ය.
3. කුපික්කල තිස්ස හිමියන් ය.
4. මලිය දේව හිමියන් ය.
5. අරිට්ඨ තෙරුන් ය.

39. 'මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජසැප පිනිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාය' යන සටන් පාඨය ඉදිරිපත් කල රජතුමා වන්නේ.

1. වළගම්බා රජතුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. එළාර රජතුමා ය.
4. මහසෙන් රජතුමා ය.
5. දේවානම් පිය තිස්ස රජතුමා ය

40. ථෙරවාදී පාලි ත්‍රිපිටකය ආරක්ෂා කොට පවත්වා ගැනීමෙහි ලා බුරුම රජවරුන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රසංසාර්හය. ප්‍රකට බුරුම බෞද්ධ රජ දරුවන් අතර අනෞරථ රජු කල වැදගත් ශාසනික ධර්ම ශාස්ත්‍රීය සේවාවක් වන්නේ.

1. ත්‍රිපිටකය බුරුම අක්ෂරවලින් ලියවා තැබීම වේ.
2. ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම වේ.
3. බෞද්ධ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම වේ
4. ත්‍රිපිටකය කිරිගරුඬ පුවරුවල ලිවීම වේ
5. ස්වේදගොන් චෛත්‍යය නිර්මාණය වේ.

41. ථායි දේශයට බුදු සමයේ ආභාසය නිසා හිමි වූ දායාදයන් ලෙස බෞද්ධ උත්සව කලාව දැක්විය හැකිය. මේ අනුව ථායිලන්තයේ වාර්ෂිකව පැවැත්වෙන විවිද බෞද්ධ උත්සව අතර ථායි රජතුමා අනිවාර්යෙන්ම සහභාගි විය යුතු උත්සවය වන්නේ

1. වෙසක් උත්සවයයි
2. කඨින උත්සවයයි
3. ඇසළ උත්සවයයි.
4. අලුත් අවුරුදු උත්සවයි.
5. මළවුන් පිදීමේ උත්සවයයි.

42. ථායිලන්තයේ මුල්කාලීනව පැවති සියම් නිකාය පසු කාලයේ දී මහා නිකාය හා ධම්මයුක්තික නිකාය වශයෙන් දෙකොටසකට බෙදන ලද්දේ

1 සූර්යවංශ රජුගේ කාලයේ ය.
2. අනවරථ රාජ්‍ය සමයේ ය.
3. කෙයංසිත්ත රාජ්‍ය සමයේ ය.
4. මොන්කුත් රාජ්‍ය සමයේ ය.
5. බෝදෝපයා රාජ්‍ය සමයේ ය.

43. චීන බෞද්ධ ඉතිහාසයේ පිළිගැනීමට අනුව එරටට බුදුදහම පළමුවරට හඳුන්වා දීම සිදු වුයේ හැංමිංදි රාජ්‍ය සමයේ ය දීය. එහි පුරෝගාමිව කටයුතු කරන ලද්දේ.

1. කාශ්‍යප මාතාංග හා ධර්මාකර හිමිවරුන් ය.
2. කාශ්‍යප මාතාංග හා සංඝපාල හිමිවරුන් ය.
3. කාශයප මාතාංග හා කුමාරජීව හිමිවරුන් ය.
4. කාශයප මාතාංග හා ශාන්තරක්ෂිත හිමිවරුන් ය.
5. කාශ්‍යප මාතාංග හා ධර්මරක්ෂ හිමිවරුන් ය.

44. ජපානයට බුදුදහම පැමිණිමට පෙරාතුව එහි පැවතියේ ස්වභාවධර්මයේ කල්පිත දෙවිවරුන් හා මළවුන් ඇදහීම මුල් කරගත් වන්දනා ක්‍රමයකි. එම වන්දනා ක්‍රමය හඳුන්වන්නේ.

1. සෙන් සම්ප්‍රදාය වශයෙනි.
2. කොම්පියුසියස් දහම නමින්ය.
3. ෂින්තෝ ආගම නමින් ය.
4. තාඕ දහම නමින් ය.
5. කිස්තු දහම නමින් ය.

45. වගන්ති 17 කින් සමන්විත ව්‍යවස්ථාවක් මගින් බුදුදහම රාජ්‍ය ආගම බවට පත් කළ ජපන් බෞද්ධ පාලකයා වන්නේ.

1. සුයිකෝ අධිරිජිණියයි 2. ක්වම්මු අධිරාජයාය. 3. සෝගාණෝ ඉනමේ අධිරාජ්‍යායාය.
4. කිම්මෙයි අධිරාජ්‍යාය 5. ෂෝතොකුතයිෂි අධිරාජයාය.

46. සෙන් බුදුදහමේ ආභාසයෙන් ගොඩනැගුණ ජපන් සංස්කෘතිය තුළ විශේෂ කලා සම්ප්‍රදායන් ඇති විය. ඒ සම්ප්‍රදායන් අතරින් **නෝ කබුකි** ලෙස හඳුන්වන්නේ

1. ඔකුම් නාට්‍ය කලාවයි. 2. මල්සැකසුම් කලාවයි. 3. චිත්‍ර කලාවයි.
4. ගීත කලාවයි. 5. තේපානෝත්සවයයි.

47. බෞද්ධ කලා සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ලෙස සැලකෙන බුද්ධ ප්‍රතිමාව උද්දේශික චෛත්‍යයට ඇතුළත් වේ. එම නිර්මාණය මුල් කාලයේ දී සිදු කිරීමට කලා කරුවා පෙළඹී නැත. ඊට ප්‍රධානතම හේතුව උතුම් ගෞරවය බව දක්වා ඇත. ඒ අනුව බුදුන් වහන්සේ **අප්පටිභාගෝ** වශයෙන් හඳුන්වා තිබේ. එයින් ප්‍රකාශ වන්නේ.

1. අද්වතීය ය නම් වේ. 2. අසහාය නම් වේ. 3 අප්‍රතිභාග නම් වේ.
4. අරහත් නම් වේ. 5. අසමසම නම් වේ.

48. වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව හඳුන්වන්නේ.

1. ධ්‍යාන මුද්‍රාව ලෙයසි 2. ධර්ම චක්‍ර මුද්‍රාව ලෙසයි. 3. අභය මුද්‍රව ලෙයසි.

4. භූමි ස්පර්ශ මුද්‍රාව පෙසයි. 5. වරද මුද්‍රාව ලෙයසි.

49. අනුස්මරණිය පුද්ගලයින් වෙනුවෙන් කිසියම් නිර්මාණයක් කොට ඔවුන්ව ගෞරවයට ලක් කිරීම ලෝකයේ බොහෝ රටවල සිදු වේ . එම ක්‍රියාව බෞද්ධ සමාජය මගින් ද දක්නට ඇත්තේ ස්තූප නිර්මාණය මගින්ය. එම නිර්මාණය විවිධ සම්ප්‍රදායන් මගින් නවතාවයකට ලක් ව ඇත. එසේ සංවර්ධනය වු ස්තූපයන්හි **ගර්භයෙන්** ප්‍රකාශිත ආගමික සංකල්පය වන්නේ.

1. සුවාසූ දහසක් ධර්මස්කන්ධයයි. 2. ත්‍රිවිධ රත්නයයි. 3. සත්තිස් බෝධිපාක්ෂික ධර්මයයි.

4. නවාංග ශාස්තෘ ශාසනයයි. 5. දිව්‍ය ලෝකයන් ය.

50. සිංහල සාහිත්‍ය පෝෂණයට බෞද්ධ සංකල්ප වස්තුබීජය වී ඇති අවස්ථා විවිධ ග්‍රන්ථ අධ්‍යයනය මගින් හමුවේ. ඒ නිර්මාණයන් අතරින් ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය, බුදුගුණ අංකාරය, ලෝ වැඩ සඟරාව සෘජු ලෙස බෞද්ධ ආභාෂය ලබා ඇත. එයින් කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ.

1. අනුරාධපුර යුගයේ ය. 2. පොළොන්නරු යුගයේ ය.

3. දඹදෙණි යුගයේ ය. 4. කෝට්ටේ යුගයේ ය. 5. කුරුණෑගල යුගයේ ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: බෞද්ධ ශිෂ්ටාචාරය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 3 |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තවේ. එයින් පළමු කොටසින් ප්‍රශ්න දෙකක් ද, දෙවන කොටසින් ප්‍රශ්න තුනක් ද, ඇතුළත්වන ලෙස ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(01)

i. බ්‍රාහ්මණ සමාජයට අයත් ස්වධර්මයන්ගෙන් දෙකක් නම් කරන්න.
ii. ආශ්‍රම ධර්මයන්ගෙන් තුනක් හඳුන්වා දෙන්න.
iii. බ්‍රාහ්මණ ආපද්ධර්ම සංකල්පය පැහැදිලි කරන්න.
iv. බ්‍රාහ්මණ අවදියේ දී කාන්තාව පුරුෂයකු යටතේ සිය ජීවිත කාලයම විසිය යුතු බව ඉගැන්වෙන අවස්ථා දෙකක් පැහැදිලි කරන්න.
v. පූර්ණකස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය විස්තර කරන්න.

(02)

i. සමූහාණ්ඩුවකින් දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.
ii. සමුද්‍ර මාර්ග ඔස්සේ වෙළඳ කටයුතු සිදුකිරීම සඳහා භාවිත කරන ලද වෙළඳ වරායන් තුනක් ගෙනහැර දක්වන්න.
iii. නව අරහාදී බුදුගුණ අතුරින් දෙකක් අරුත් සහිතව පැහැදිලි කරන්න.
iv. බුද්ධ චරිතය පුරාවට ම පිළිබිඹුවන මහා කරුණාව උදාහරණ තුනක් ඇසුරින් හඳුන්වා දෙන්න.
v. අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පැහැදිලි කරන්න.

(03)

i. සතර සංග්‍රහවස්තු අතරින් දෙකක් නම් කරන්න.
ii. අෂ්ටාංග සීලයෙන් තුනක් අර්ථ සහිතව පෙන්වා දෙන්න.
iii. **අප්පමාදේන මඝවා**.....යන ගාථාව සම්පූර්ණ කරන්න.
iv. එහි අර්ථය නිවැරදිව ලියා දක්වන්න.
v. පුද්ගලයෙකුගේ පරිහාණියට හේතුවන කරුණු තුනක් පරාභව සූත්‍රය ඇසුරින් විස්තර කරන්න.

II කොටස

(04)

i. පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වර්තමාන මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයටවන අහිතකර බලපෑම් වලක්වාලීමට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවකයන් වහන්සේලා ද සුන්දර පරිසරය අගය කොට ඇති ආකාරය සදෘපයන් සහිතව විස්තර කරන්න.

05)

i. බුද්ධ කාලීන ධර්ම දූත කාර්යය සාර්ථක කර ගැනීම සඳහා භික්ෂු-භික්ෂුණීන්ගෙන් ලැබුණ දායකත්වය සනිදර්ශනාත්මකව විස්තර කරන්න.

ii. ධර්ම සංගායනාවක් යනු කුමක්දැයි පැහැදිලි කොට සම්බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා පළමු සංගායනාවෙන් සිදුවූ මෙහෙය ඇගයීමට ලක් කරන්න.

(06)

i. අශෝක රජු විසින් කරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරින් ඇගයීමට ලක් කරන්න.

ii. භාරතයේ පැවති පැරණි විශ්වවිද්‍යාල අතරින් නාලන්දා විශ්විද්‍යාලයේ පරිපාලන පටිපාටිය කෙසේ සිදුවූයේ ද යන්න පැහැදිලි කරන්න.

(07)

i. මහින්දාගමනයෙන් පසු ලාංකේය ඇහිලි හා විශ්වාස මෙන්ම ජන ජීවිතයද උපතේ සිට මරණය දක්වා ම වෙනස් වු ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ii. සියමට බුදුසමය හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම කෙටියෙන් ගෙනහැර දක්වා එරට ජන ජීවිතය බුදුසමයෙන් පෝෂණය වු ආකාරය පැහැදිලි කරන්න.

(08)

i. බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ පවත්නා මත පැහැදිලි කොට ගන්ධාර මථුරා ප්‍රතිමාවන්ගේ දක්නට ඇති ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

ii. සිංහල ගද්‍ය හා පද්‍ය පමණක් නොව ගීත කලාව මගින් ද ජන හදවත් තුළට බුදුදහම සන්නිවේදනය කිරීමට සාහිත්‍යකරුවා කටයුතු කර ඇති ආකාරය උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**බෞද්ධ ශිෂ්ටාචාරය I**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය**

**General Certificate of Education (Adv. Level) Examination**

**පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

| 45 | S | I |
|---|---|---|

පැය දෙකයි
**Two Hours**

**උපදෙස්:**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර යටින් ඉරි අඳින්න.

---

පිළිතුරු පත්‍රය 1

1-2
2-4
3-5
4-4
5-5
6-3
7-3
8-4
9-1
10-2
11-2
12-1
13-2
14-3
15-1-4
16-3 ( මෙම ප්‍රශ්නයේ පිළිතුර සටහන් නොවීම නිසා පිළිතුරු ලබා දෙන්න.) සිතින් සිදුවන ක්‍රියා තුනකි
17- 3
18-1
19-2
20-3
21-1
22-2
23-5
24-4
25-5 (මෙම ප්‍රශ්නයේ පිළිතුර විසි අට වෙනුවට තිස් අට වියයුතුය) ලකුණු ලබා දෙන්න. පිළිතුර සටහන් නොවුණ නිසා
26-4

27-1
28-3
29-3
30-3
31-1
32-2
33-2
34-3
35-4
36-1
37-2
38-2
39-2
40-1
41-2
42-4
43-5
44-3
45- 5
46- 1
47-3
48-1
49-3
50-4

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**බෞද්ධ ශිෂ්ටාචාරය II**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය**

**General Certificate of Education (Adv. Level) Examination**

**පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තවේ. එයින් පළමු කොටසින් ප්‍රශ්න දෙකක් ද, දෙවන කොටසින් ප්‍රශ්න තුනක් ද, ඇතුළත් වේ ඒ සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.

# පිළිතුරු පත්‍රය

(01)

i. ඉගෙනීම, ඉගැන්වීම, යාලකිරීම, යාගකරවීම, දන්දීම, දන්පිළිගැනීම.
ii. බ්‍රහ්මචාරී අවදිය- ඉගෙන ලන්නා කාලය, ගෘහස්ථ අවදිය- කම්සැප විදින කාලය, වනාප්‍රස්ථ අවදිය- කම්සැප අතහරින හෙවත් වනගත වන කාලය, සංන්‍යාසී අවදිය- බ්‍රහ්මසහව්‍යතාවය පතා යෝගීව කටයුතු කරන අවදිය.
iii. ආපදාපන්න අවස්ථාවකදී කිරීමට ඇති වගකීම්, ඉහළ සිට පහළට පැවරෙන් කාර්යයන් ආපද් ධර්ම වේ. බමුණන්ට ක්ෂත්‍රිය වෛශ්‍යයන්ගේ කාර්යයන් ද, ක්ෂත්‍රියන්ට වෛශ්‍යයන්ගේ කාර්යයන් ද, වෛශ්‍යයන්ට ශුද්‍රයන්ගේ කාර්යන්ද අයත් වේ. ශුද්‍රයන්ට ආපද්ධර්මයක් නැත.
iv. කුඩා කාලයේ පියා යටතේ ද, විහවාහයෙන් පසු ස්වාමියා යටතේ ද, ස්වාමියා මළ පසු වැඩිමහල් පුත්‍ර යටතේ ද, විසිය යුතු අතර, ෂතිපුජාවේ දී සිය ජීවිතය ස්වාමියා වෙනුවෙන් කැප කළ යුතු බව.
v. කරන හොඳ හෝ නරක ක්‍රියාවන්හි විපාක නැතැයි ප්‍රකාශ කිරීම, සියතින් කරන්නා ද, අනුන් ලවා කරවන්නා ද. අනුන්ගේ අත්පා සිඳින්නා ද, සිඳවන්නා ද, අනුන් දඬුවමින් පෙළන්නා ද, පෙළවන්නාට ද, පවක් සිදු නොවන බව. සමස්ථ පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළ ද, ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැතැයි ඉගැන් වූ බව. ගංගානම් ගඟේ දකුණු කෙළවර දක්වා ගමන් කරමින් හමුවන සියලුම ප්‍රාණීන් මරමින්, මරවමින්, සිඳමින්. සිඳවමින් ගමන් කළ ද, එයින් සිදුවන පවක් නැතැයි ඉගැන් වූ බව.

02

i. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ බලතල කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම සමුහිකව තීරණ ගැනීම සහ පිළිතුරට අදාළව ලකුණු දෙන්න.
ii. සුප්පාරක, භාරුකච්ච, තාම්‍රලිප්ති
iii. අරහං, සම්මාසම්බුද්ධ,විජ්ජාචරණසම්පන්න, සුගත, ලොක්විදු, අනුත්තරෝ පුරිසධම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා මෙයින් විස්තර කර ඇති ආකාරයට අනුව ලකුණු දෙන්න.

iv. කරුණාව හඳුන්වා දීම අවශ්‍ය වේ. සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තිස්ස, ආදී චරිත මෙන්ම අනෙක් ඉදිරිපත් කර ඇති චරිත ප්‍රශ්නයට ගැලපේනම් ෂලා ලකුණු දෙන්න.
v. නිර්ලෝභී බව, දීමෙහි ඇලුන, හිතමිතුරන් පවා සුමගටයොමු කිරීම, ශ්‍රද්ධාවන්ත බවආදී ගුණ ඇතුළත්වීම වැදගත්.

03.

i. දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, සමානාත්මතාව
ii. පාණාතිපාතා, අදින්නිදානා, අබ්‍රහ්මචරියා, මුසාවාදා, සුරාමේරය, විකාලභෝජනා, නස්සගීත-මාලාගන්ධ, උච්චාසයනා.......... ය කරුණු අතරින්.
iii. අප්පමාදේන මඝවා-දේවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති-පමාදෝ ගරහිතෝ සදා

i. ශක්‍රයා දෙවියන් අතර ශ්‍රේෂ්ඨ වුයේ නොපමා බව නිසා ය. බුද්ධාදී උතුමෝ නිතරම නොපමා බව පසසත් පමාව හැම කල්හි ගරහන ලදි.
ii. ධර්මයට කැමති තැනැත්තා දියුණු වන්නා ය. ධර්මයට ද්වේශ කරන්නා පිරිහෙන්නේ ය. අසත්පුරුෂයින් ප්‍රියවෙයි. සත් පුරුෂයින් අප්‍රිය වෙයි. මේ ආකාරයට උදාහරණ යොදා ඇති ආකාරය සලා පිළිතුරුට ලකුණු ලබා දෙන්න.

04

1

- බුදුන් වහන්සේ මෙන්ම ශ්‍රාවක භික්ෂූණ් ද පවිතුරු සුන්දර පරිසරයට ඇලුම් කළ බව

- සංයුක්ත නිකායේ වනරෝපම සූත්‍රයේ වෘක්ෂලතා ා පරිසරය සංරක්ෂණයට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇති ආකාරය
  ආරාම රෝපා වන රෝපා

  යේ ජනා සේතු කාරකා

  පපඤ්ච උදපානංච

  යේ දදන්ති උපස්සයං

  තේසං දිවාච රත්තෝච

  සදා පුඤ්ඤං පවඩ්ඪති

  ධම්මට්ඨා සීල සම්පන්නා

  තේ ජනා සග්ගගාමිනෝ.

- විනය ශික්ෂාවන්හි මෙන් ම සේඛියාවල ද පරිසර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත් වන බව ගස්වැල් සිඳීම, සියලු ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස දක්වා තිබීම වර්තමාන මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් පරිසරයට අහිතකර ලෙස බලපා ඇති බව සහ එයම්නිසා සහිත සත්ත්ව හා ශාක ප්‍රජාවේ යහපැහැත්මට තර්ජනයක් වී ඇති බව මෙයින් පැහැදිලි ය.
- ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව

- මෙම කරුණු විස්තර විය යුතුය. සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න. **(ලකුණු 10)**
  2.

- දිග නිකායේ පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ආකාරයට කුසිනාරාව බලා බඩින බුදුන් වහන්සේ ඒ අවට පරිසරය වර්ණනා කළ ආකාරය. රමණීයං ආනන්ද වේසාලියං, රමනීයං උදේන චේතියං........
- අරියපරියේසන සූත්‍රය සිදුහත් තාපස කාලයේ උරුවෙල් දනව්වේ සිටිය දී දුටු අංකාරය වර්ණානා කරීම.
- දීග නිකායේ සක්කපඤ්හ සූත්‍රය, පඤ්චසිකගේ වීණාවාදනය ඇගයීමට ලක් කිරීම.
- උග්ගසේන නැමැති දක්ෂ සරඹ ශිල්පියාගේ කුෂලතා ඇගයීමට ලක් කිරීම. බුදුන් වහන්සේගේ වර්ණනාවන්ට අයත් වේ.

- ථේර-ථේරී ගාථා (උදාහරණ යොදාගෙන තිබීම)
- සප්පක නම් හිමිගේ පරිසර වර්නනාව (තැනී ගනියි දැක වැහි වලාවක්........)
- කාලුදායි තෙරුන්ගේ පරිසර වර්ණනාව (කිඹුල්වත්පුර වර්ණනාව)

මෙම සාධකවලට අදාළව දක්වා ඇති පිළිතුරු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. (ලකුණු 10යි)
05

1. බුද්ධ කාලීන ධර්ම දූත සේවාව ප්‍රධාන ආකාර දෙකකි.

- බුදුන් වහන්සේ විසින් කරන සේවාව හා ශ්‍රාවක සංඝයා විසින් කළ සේවය.

- ප්‍රථම රහත් හැටනමට දුන් උපදේශනය **චරථ භික්ඛවේ චාරිකං.....**

- සැරියුත්, මුගලන්, ආනන්ද, පුණ්ණමන්තානි, මහාකච්චායන, මහා කාශ්‍යප, සුනාපරන්තවාසී පුණ්ණ යන ධර්මධර භික්ෂූන්ගේ සේවාවන් පිළිබඳව වෙන වෙනම විස්තරාත්මක තොරතුරු අවශ්‍ය වේ.

- සේලා, වජිරා, සෝමා වැනි භික්ෂුණීන්ගේ සේවාවන්

- මෙම කරුණු විස්තර වී තිබීම ප්‍රමාණවත් වේ. (ලකුණු 10යි)

2. ශාසනයේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් මහතෙරවරුන් රැස් වී බුද්ධ වචනය පිළිබඳ ව සාකච්ඡා කිරීම හා අවශ්‍ය තීරණවලට එළඹීම සංගායනාවක් පැවැත්වීම යන්නෙන් අදහස් වේ.

ශාසනයේ චිර පැවැත්මට පළමු සංගායනාවෙන් වු දායකත්වයේ දී

විසිරී පැවති ධර්මය ඒකරාසී කිරීම

අධර්මවාදීන් නිසා සසුනට විය හැකි හානිය වැළැක්වීමේ අදහසින් සුභද්‍ර වැනි භික්ෂූන් නිහඬ කරවීම.

ධර්මය හා විනය වෙන වෙනම සංගායනා කිරීම හා එය මුඛ පරම්පරාවක් මගින් ඉදිරියට පවත්වාගෙන යාමට පැවරීම.

පවත්නා ශික්ෂා පද වෙනස් නොකිරීමට තීරණය ගැනීම

චන්න හිමියන්ගේ ක්‍රියාවන්ට දඬුවම් පැනවීම

(මෙම කරුණු පිළිබඳ විස්තරාත්මක පිළිතුරක් අපෙක්ෂා කරනු ලබයි) **ලකුණු 10යි.**

06

1. ශාසන සංශෝධනයක් ඇති කිරීම. කාලයක් තිස්සේ බුදු සසුන තුළ පැවැති අර්බුදයක් විසඳා වසර 7ක් තිස්සේ සිදු නොකළ විනය කර්මය පවා සිදු කිරීමේ පරිසරයක් රජු විසින් ම සැලැස්වීම.

2. දුසිල් මහණුන් 60,000 ක් සසුනෙන් නෙරපා ශාසන පාරිශුද්ධිය ප්‍රථමයෙන් ම ඇති කිරීම රජු විසින් සිදු කළ උත්තරීතර හා වැදගත්ම සේවය විය.

3. දිග් විජය මගින් විශාල වශයෙන් රාජ්‍යයන් අල්ලා ගැනීම සිදු කළ රජු විසින් එම ක්‍රමයෙන් අයින් වී ධර්ම විජයට එකතු විය. එමගින් විශාල ලෙස වෙහෙර විහාර නිර්මාණය කිරීම පිං කිරීම නඩත්තු කිරීම් සිදු කර තිබේ. විහාර යාත්‍රාව වෙනුවට ධර්ම යාත්‍රාව ද මෙතුමා විසින් ආරම්භ කරන ලදී. එයින් ද සම්බුද්ධ ශාසනයේ උන්නතිය අපේක්ෂා කර ඇත. මෙම ක්‍රම දෙක මඟින් විහාර මන්දිර, සංඝාරාම ඇති විය. ඒවාගේ ආරක්ෂාවන් සඳහා කටයුතු කර තිබේ.
4. බුද්ධ චරිතයේ සුවිශේෂී ස්ථාන ගල්කුළුණුවල ලියා ඒවා රැක ගැනීමට කටයුතු කිරීම අශෝක රජු විසින් කර ඇත. එය ද එතුමා ආගමිකමය වශයෙන් සිදු කළ වටිනාම සේවයක් වේ.

5. තෙවන ධර්ම සංගායනාව මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ මග පෙන්වීම යටතේ සිදු කරන ලදී. එය ද ඉතා වටිනා ආගමික සේවාවක් ලෙස සැලකේ.

6. භික්ෂූන්ගේ සැප පහසුව තකා 84,000 ක් වෙහෙර විහාර නිර්මාණය කර සම්බුද්ධ ශාසනය වෙනුවෙන් පූජා කිරීම ද අශෝක රජුගේ ආගමික සේවාවකි.

7. සාංචිය නිර්මාණය කිරීම හා ඒ හා දාගැබ් නිර්මාණය කිරීම.

8. කිඹුල්වත් පුරය බද්දෙන් නිදහස් කිරීමත් බුදුන් වහන්සේට දැක්වූ ගෞරවයක් ලෙස දැක්වේ.

9. කෝනාගම බුදුන් වහන්සේගේ ස්තූපය දෙගුණයක් කොට සෑදීම තවත් කරුණක් වේ.

10. සත්ත්ව ඝාතනය නතර කිරීම. යාගයන් සඳහා දහස් ගණනින් මරා දමන සත්ත්ව කොට්ඨාශවලට ජීවිත දානය ලබා දීම රජුගේ අපේක්ෂාව විය.

11. මිහිඳු කුමරු හා සංඝ මිත්තා දියණිය සසුනට පූජා කිරීම එතුමාගේ ආගමික සේවාවන්ගේ වැදගත් ලක්ෂණ වේ.
12. ධර්ම දූත සේවාව ආරම්භ කිරීම.
13. තානාධිපති සම්බන්ධතා ආරම්භ කිරීම.
14. ධර්ම මහා මාත්‍යවරුන් පත් කිරීම.
15. සෙල්ලිපි ගිරිලිපි, පිහිටුවීම (ධර්මය සටහන් කර)
16. ධර්මදේශකයන් වහන්සේලා යෙදවීම.
17. දරුවන් දෙදෙනාව පැවිදි කර ධර්ම චාරිකාවේ යෙදවීම.
18. ධර්ම යාත්‍රාව මඟින් දහම කියාදීම ආරම්භ කිරීම.
19. අසූහාරදාහක් වෙහෙර විහාර සැකසීම.
20. සංගායනාවක් පැවැත්වීම.
21. රටවල් නවයකට ධර්මය යැවීම.
22. අශෝක දහමක් නිර්මාණය කර එයින් පුද්ගල ලෞකික ජීවිතයට ධර්මයේ වටිනාකම සරල ව කියා දීමට කටයුතු කිරීම.

(මෙම කරුනු දෙස බලා අදාළ ලෙස ලකුණු ලබා දෙන්න) ලකුණු 10යි

6

ii

**1.** පිහිටීම

නැගෙනහිර බිහාර් ප්‍රාන්තයේ රාජ්ගීර්හි (පුරාණ මගධයේ රජගහ නුවර) සිට සැතපුම් අටක් පමණ උතුරින් නාලන්දා ග්‍රමයේ / නූතන නාලන්දා ග්‍රාමය ඔැර්ගාමින් ලෙස ද ජනප්‍රයයි.

**2.** මූලාශ්‍ර

- ලිඛිත-නාලන්දාවේ වසර 15ක් පමණ ශිෂ්‍යයෙකු හා ආචාර්යවරයෙකු ලෙස කටයුතු කළ චීන ජාතික හියුං සියැං හිමිගේ වාර්තාව
- නාලන්දාවේ අධ්‍යාපනය ලැබූ ඉත්සිං හිමිගේ වාර්තා
- හුයිලී රචනා කර තිබෙන හියුංසියැං චරිතාපදානයේ විස්තර
- ටිබෙට් විස්තර වාර්තා

- ක්‍රි.ව. 15 වන සියවස තාරනාථ පඬිවරයා රචනා කර තිබෙන බෞද්ධ ඉතිහාසය නම් ග්‍රන්ථයේ විස්තර
- පුරාවිද්‍යාත්මක කැණීම් මගින් තහවුරු කරගත් සාක්ෂි (නටඹුන්, සෙල්ලිපි ආදිය)

**3.** ඓතිහාසික තත්වය
- නිගන්ඨනාතපුත්ත තුමා හා මක්ඛලීගෝසාල තුමා මුණගැසීම.
- බුදුරදුන් කිහිපවිටක්ම සංචාරය කර තිබීම.
- මුගලන් හිමිගේ ජන්ම ලාභය හා පරිනිර්වාණය සිදු වීම.
- සැරියුත් හිමිගේ ජන්ම ලාභය හා පරිනිර්වාණය සිදු වීම , ධාතු තැන්පත් කර චෛත්‍යයක් තැනීම.

**4.** මූලාරම්භය
ක්‍රි.ව. 2 - 3 සියවස්වල නාගාර්ජුන , ආර්යදේව , ධර්මපාල බඳු බෞද්ධ දාර්ශනික හිමිවරු වැඩ වාසය කිරීම. මෙම හිමිවරුන්ට අමතරව රාහුල බද්‍ර, අසංග, වසු බන්දු දින්නාග, ගුණමති, ස්තිරමතී, ජයදේව, චන්ද්‍ර කීර්ති, ප්‍රභාමිත්‍ර, චන්ද්‍රගෝමීන්, ජිනමිත්‍ර, ධර්මපාල, ශීලභද්‍ර, ධර්ම කීර්ති, ශාන්තරක්ෂිත, කමලශීල, බුද්ධ කීර්ති, යන හිමිවරු කීර්තිමත් ආචාර්යවරුන් වූහ.

**5.** රාජ්‍ය අනුග්‍රහය
- සක්‍රාදිත්‍ය හෙවත් පළමු කුමාරගුප්ත රජු (ක්‍රි. 415 - 455 දී) විහාරයක් ව පැවැති නාලන්දාව පළමුවරට විද්‍යාස්ථානයක් ලෙස සංවර්ධනය කොට උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට එය පත් කර ඇත.
- මහා විහාරය නමින් හැදින් වූ නාලන්දාව සක්‍රාදිත්‍ය රජුගෙන් පසුව එතුමාගේ පුතකු වන බුද්ධගුප්ත රජු (ක්‍රි. ව. 455 - 467 දී) , තථාගතගුප්ත රජු (වික්‍රමාධිත්‍ය - ක්‍රි.ව. 467 -500 දී) නරසිංහගුප්ත රජු (බාලාදිත්‍ය - ක්‍රි.ව. 500-525 දී), දෙවන කුමාරගුප්ත රජු (වජ්‍ර - ක්‍රි.ව. 525 න් පසු) ක්‍රමයෙන් දියුණු කරන්නට විය.
- හර්ෂ , පාල අධිරාජ්‍යවරුන්ගේ අනුග්‍රහය

**6.** ගොඩනැගිලි
- විශ්වවිද්‍යාලය වටා උස් ප්‍රාකරයකි, මහල් පහකින් යුතු සංඝාරාම හයකි. කඳු මුදුන් මෙන් ඉහළට විහිදුණු වළාකුළු ස්පර්ශ කරන කුටාගාර හා මුදුන්කොත් , ආකාශවස්තු , පර්යේෂණාගාර , විවිධ කැටයම් හා මකර තොරණින් අලංකාර කරන ලද ගොඩනැගිලි පුස්තකාල , විද්‍යාගාර , දේශනශාලා , ශිෂ්‍ය මධ්‍යස්ථා , රසායනාගාර, වෛද්‍ය විද්‍යාල, රෝගී නේවාසිකාගාර, භාවනා කුටි , ක්‍රීඩාගාර, ප්‍රතිමාඝර, විහාර මන්දිර , පළතුරු මල් පොකුණුවලින් අලංකෘත උයන් වතු මෙහි දක්නට ඇත.
- නටඹුන් හෙක්ටයාර් 14 ක් පමණ භූමියක පැතිරී ඇත.

**7.** පුස්තකාලය - ධර්මගඤ්ජ (ගොඩනැගිලි, මහල් නමයකින් යුක්ත) රත්නසාගර - රත්නෝදය - රත්නරංජන වශයෙන් පුස්තකාල තුනක් ඇත. මෙහි කැනීම් වලින් බුද්ධ ප්‍රතිමා, බෝසත් ප්‍රතිමා, දේව ප්‍රතිමා, ශිලාලේඛන, රාජ මුද්‍රා, විශ්වවිද්‍යාලීය මුද්‍ර, සොයාගෙන ඇත.

**8.** නේවාසික පිරිස - 10000 පමණ
- අධ්‍යයන - අනධ්‍යයන

**9.** ආචාර්යවරු‍ 1510( 1500)
1. සූත්‍ර හා ශාස්ත්‍ර කොටස් - විස්තර විවරණය කළ හැකි පිරිස
2. සූත්‍ර හා ශාස්ත්‍ර කොටස් - විස්තර විවරණය කළ හැකි පිරිස
3. සූත්‍ර හා ශාස්ත්‍ර කොටස් - විස්තර විවරණය කළ හැකි පිරිස

**10.** කුලපති හිමි
- සියලු සූත්‍ර හා ශාස්ත්‍ර කොටස් විස්තර විවරණය කළ හැක.
- උන්වහන්සේ ඥානවෘද්ධ , ගුණවෘද්ධ , තපෝවෘද්ධ වූහ.
- ආචාර්ය, ශිෂ්‍ය , සේවක යනාදීන්ගේ නොමඳ ගෞරවයට පාත්‍ර වූහ.
- ශීලභද්‍ර හිමි (ක්‍රි.ව. 7 දී) සුප්‍රකට කුලපතිවරයා විය.
- අවසාන කුලපති ශාක්‍ය ශ්‍රී භද්‍ර හිමි ය.

**11.** පරිපාලනය - කුලපති හිමිට සහාය දීමට කෘත්‍යාධිකාර මණ්ඩල දෙකකි. එම මණ්ඩල දෙකෙන් සමස්ත විශ්ව විද්‍යාලයේම පාලනය එම මණ්ඩල දෙකෙන් සිදු විය.

1. සිසුන් ඇතුළත් කිරීම , පාඨමාලා සැකසීම, විභාග පැවැත්වීම , ග්‍රන්ථ සම්පාදනය ආදී ශාස්ත්‍රීය කටයුතු පළමු මණ්ඩලට අයත් ය.
2. ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව , නේවාසික පිරිස් සඳහා සිව් පසය සැපයීම, සේවකයන් පාලනය , ගම්වර පාලනය, ධාන්‍ය රැස් කිරීම , සියලු දෙනාගේ සුබ සාධන කටයුතු ඉටු කිරීම. දෙවන මණ්ඩලයට අයත් ය.
3. උපකුලපතිගේ සිට සුළු සේවකයා දක්වා විධිමත් බව
4. ශුද්ධ පවිත්‍ර කිරීම , උද්‍යාන සැකසීම, ආහාර පාන පිළියෙල කිරීම , ජල සම්පාදනය , දර රැස් කිරීම ආදී පොදු කටයුතු සඳහා වෙන වෙනම සේවක පිරිස්

**12.** ශිෂ්‍ය පිරිස - 7000 ක් පමණ
- ❑ බ්‍රහ්මචාරී ගිහි - පැවිදි , වැඩි පිරිස භික්ෂූන් ය.
- ❑ 1500ක් පමණ ගිහි මානවක පිරිසක් ආචාර්යවරුනට උපස්ථාන කරමින් අධ්‍යයන කටයුතුවල නිරත වීම.
- ❑ දේශීය - විදේශීය
- ❑ බෞද්ධ - අබෞද්ධ
- ❑ සියල්ලන් ම නේවාසික ය.

**13.** ප්‍රවේශය
- ❑ ප්‍රවේශ වීම ඉතා දුෂ්කර ය.
- ❑ ඇතුළත් වීමට තියුණු පරීක්ෂනයෙන් සමතය. එය සිදු කරන්නේ 'ද්වාරපණ්ඩිත'නාමයෙන් පිදුම්ලත් ආචාර්ය වරයෙකු විසින්ය.

**14.** සුදුසුකම්
- ❑ සංස්කෘත භාෂාව , සංස්කෘත ධර්ම ග්‍රන්ථ හා බුද්ධ ධර්මය පිළිබඳ ගැඹුරු දැනුමක් හා මනා අවබෝධයක් තිබිය යුතුය.
- ❑ විශ්වවිද්‍යාල ප්‍රවේශය භාරවූයේ ද්වාරපණ්ඩිත නම් ආචාර්ය මණ්ඩලයට යි.
- ❑ ප්‍රවේශය 80% ක් පමණ අසමත් වේ.
- ❑ විදේශීය සිසුන්ගෙන් දස දෙනෙකුගෙන් තිදෙනෙකු පමණ ප්‍රවේශය ලබයි.

**15.** අධ්‍යාපනය අංශ තුනකින් යුක්තය.

1. ද්විතියික අධ්‍යයාපනය - මූලික අධ්‍යාපනය ලබා ඇති පසලොස් හැවිරිදි ශිෂ්‍යයන් පුරා වසර 8ක් ශිල්ප හැදෑරිය යුතු ය.
2. උපාධි - විසි වයස් සම්පූර්ණ කර තිබෙන වසර 3ක්
3. පශ්චාත් උපාධි ලැබීමට පැමිණ සිටි සිසු පිරිස -දැනුම් කුසලතා ප්‍රවර්ධනය කර ගැනීමට හෝ කීර්තිමත් නාලන්දාවේ විද්‍යාර්ථියෙකු වීමේ අපේක්ෂා ඇති දෙස් විදෙස් ශිෂ්‍යයන්

**16.** විෂය ධාරා

1. භාෂා අධ්‍යයන විෂය ධාරාව
   - සංස්කෘත භාෂාව - ඡන්දස් , ව්‍යාකරණ , නිරුක්ති , අලංකාර යනාදිය

2. බුද්ධ ධර්මය අධ්‍යයන විෂය ධාරාව
   - මහායානික ඉගැන්වීම් - මහායාන සාහිත්‍ය (සූත්‍ර , ශාස්ත්‍ර , විභාෂා)
   - අභිධර්මය - න්‍යාය ශාස්ත්‍රය
   - තන්ත්‍රායානයට අයත් පොත් පත් ද අධ්‍යයනය කළ යුතුය.

3. දර්ශන අධ්‍යයන විෂය ධාරාව
   - චතුර්වේදය - බ්‍රාහ්මණ , ආරණ්‍යයක , උපනිශද් යන ග්‍රන්ථ ද, සංඛ්‍යා යෝගද, න්‍යාය, වෛශේෂික, පූර්ව මීමාංසා, උත්තර මීමාංසා යන ෂඩ් හින්දු දර්ශනය ද, මෙහි උගන්වා ඇත.

4. ලෞකික අධ්‍යයන විෂය ධාරාව
   - රාජ්‍ය පාලනය
   - වාණිජ කටයුතු
   - කෘෂිකර්මය

- ජ්‍යෝතිශ්‍ය (යන්ත්‍ර මන්ත්‍ර)
- තාරකා විද්‍යාව
- කාලගුණ විද්‍යාව
- ආයුර්වේද වෛද්‍ය විද්‍යාව (රෝග හඳුනාගැනීම , රෝග විනිශ්චය , ඖෂධ නියම කිරීම , රසායනික බෙහෙත් පිළියල කිරීම, කටු චිකිත්සක ක්‍රම, ශල්‍ය කර්මද මෙයට අයත්ය)

5. ලලිත කලා අධ්‍යයන විෂය ධාරාව
- සෞන්දර්යය රසඥතාව ප්‍රවර්ධනය
- සංගීත , චිත්‍ර, නර්තන
- මූර්ති ශිල්පය , වාස්තු විද්‍යාව , කැටයම් කලාව, කාව්‍ය හා නාටක ශාස්ත්‍ර

**17.** අධ්‍යයන ක්‍රමවේද අංග තුනකින් යුක්තය.

1. දේශන ක්‍රමය (දිනකට දේශන 100 කට වඩා)
2. විවාද ක්‍රමය (විවාදාපන්න ඕනෑ ම කරුණක් ඕනෑම විද්‍යාර්ථීකයෙකුට තර්ක විතර්ක කිරීමට නිදහස)
3. පෞද්ගලික සාකච්ඡා (සෑම ශිෂ්‍යයෙකුටම පෞද්ගලික ආචාර්යවරයෙක් විය. ඔහු ශිෂ්‍යයාගේ අවශ්‍යතා, ඉගෙනීම් ස්වභාවය , දුර්වලතා, ඒ සඳහා පිළියම් අධ්‍යයන ගැටලු නිරාකරණය යනාදිය ඉටු කළේ ය. එසේ ම ශිෂ්‍යාගේ හැසිරීම හා විනය කෙරේ සැලකිල්ලක් දැක්වූවේ ය.)

**18.** පහසුකම්

- ❑ නිදහස් අධ්‍යාපනය - සිව්පසය සම්පාදනය

**19.** ශාස්ත්‍රීය කටයුතු

- ❑ නාගර්ජුන හිමි - මූලමධ්‍යමකකාරිකාව
- ❑ දින්නාග හිමි - න්‍යාය ප්‍රවේශය , න්‍යාය ද්වාර , ප්‍රමාණ සමුච්චය
- ❑ චන්ද්‍රකීර්ති හිමි - මූලමධ්‍යමකකාරිකා වෘත්ති
- ❑ වසුබන්ධු හිම - අභිධර්ම කෝෂ , විඥප්තිමාත්‍රතාසිද්ධි ශාස්ත්‍ර
- ❑ ශාන්ත රක්ෂිත හිමි - තත්ත්ව සංග්‍රහ
- ❑ කමලශීල හිමි - තත්ත්ව සංග්‍රහ පඤ්ජිකා

**20.** ධර්මදූත සේවා

- ❑ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයක කටයුතු
- ❑ ආචාර්යවරුන්ගේ ධර්ම ප්‍රචාරණ කටයුතු (ශාස්ත්‍ර , රක්ෂිත , පද්මසම්භව, කමලශීල යනාදී හිමිවරු)
- ❑ විදේශ ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා දීම (පර්සියාව, ග්‍රීසිය, මොංගෝලියාව, ටිබෙටය , චීනය , කොරියාව, ජපානය, ජාවා, සුමාත්‍රා, ශ්‍රී ලංකාව ආදී)

**21.** විනාශය

- ❑ ලොව සුපතල කීර්තිමත් විශ්ව විද්‍යාලයක් වූ නාලන්දාව වසර දෙදහසක් විරාජමානව බැබලුණි. එය මුස්ලිම් ආක්‍රමණික භක්තියාර් ඛිල්ජි ප්‍රමුඛ පිරිස (ක්‍රි.ව.13 දී) භික්ෂූන් සමූලඝාතනයක් කොට විනාශ කර දමා ඇත.
- ❑ කෲර ලෙස භික්ෂූන් ඝාතනය, සංඝාරාම , පුස්තකාලය ඇතුළු සියලු ගොඩනැගිලි ගිනි තැබීම. සිදු කිරීමෙන් පසුව මේ අධ්‍යාපන ආයතනය විනාශ වී ඇත. ඩ

7

I මහින්දාගමනයෙන් පසු ලාංකේය ඇහිලි විශ්වාස බෞද්ධ මුහුණුවරක ගෙන ඇති ආකාරය

- වෘක්ෂ වන්දානාව බෝධි වන්දනාව බවට පත් වීම
- මළවුන් පිදීම මළවන් සඳහා පින් දීමට පරිවර්තනය වූ බව
- දෙවියන්ට බිලිබිලි පූජා කිරීම වෙනුවට දෙවියන්ට පින් දීම ආරම්භ වීම
- ස්තූපය, ප්‍රතිමාව ආදී බෞද්ධ ස්මාරක ආරම්භ වී ඒ සඳහා වන්දනයට යොමු වූ බව
- සිරිත් විරිත් හඳුනා ගැනීම
  - පන්සිල් රැකිකීම
  - සතුන්ට කරුණාව මෛත්‍රිය දැක්වීම
  - දරු සම්පත් අපේක්ෂාවෙන් පාර්ථනා කිරීම්
  - අංගුගිමාල පිරිත කියවීම
  - නම් තැබීම
  - අකුරු කියවීම
  - නිසි කළ විවාහ කිරීමේ දී ආගමික ආශිර්වාදය ලබා දීම
  - ගෘහ කටයුතු වල දි ආශිර්වාද ලබීම

- මිය ගිය විට පූජාවන් පැවැත්වීම
- හත් දින දානය
- තුන් මාසේ දානය
- අවුරුද්දේ දානය පැවැත්වීම

මෙම කරුණු කෙරෙහි අවදානය යොමු කරන්න ලියා ඇති පිළිතුර කෙරෙහි අවදානය යොමු කොට ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

* ii තායිලන්තයට හෙවත් සියමට බුදුදහම හඳුන්වා දීම පිළිබඳව විවිධ මත පවතියි. ඒ අතර ඇති වැදගත්ම සාධකය වන්නේ සෝණ හා උත්තර දෙනම මුලින්ම මෙරටට බුදු දහම හඳුන්වා දුන් බව කියවෙන මතය යි. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිපලයක් ලෙස අශෝක රජු විසින් කරන ලද ධර්ම ප්‍රචාරක සේවාවේ දී සෝණ උත්තර දෙනම විසින් මෙහි බුදු දහම පැතිර වූ බව කිය වේ. ඉන් පසුව රාජ්‍ය අනුග්‍රහය මත මෙහි බුදු දහම ව්‍යාප්ත වී ඇත. බෞද්ධ ඉතිහාසයේ දැක්වෙන ආකාරයට එය සාධකයක් ලෙස දැක් විය හැකිය.
* තායිලන්තයේ ප්‍රථම නගරය වූ නකෝම් පටෝන් නගරය මුල් කරගෙන බුදුදහම තායිලන්තය තුළ ව්‍යාප්ත විය. බෞද්ධ කලා ශිල්ප ඔස්සේ විවිධ දාගැබ්, පිළිම වහන්සේලා ඉතා උසස් ලෙස නිර්මාණය කරමින් විවිධ ආගමික පිළිවෙත් ඔස්සේ බුදු දහම ජනජීවිතයට ලංවීම නිසා මෙහි දහම ව්‍යාප්ත විය.
* මොන්වරුන්ගේ මැදිහත් වීම නිසාද බුදුදහම ව්‍යාප්ත වී ඇත. රජු නිරන්තරවම එයට මැදිහත් වීම නිසාම මෙය තවත් වර්ධනය වී ඇති බව පෙනෙයි.
* මුලින්ම තායිලන්තයට බුදු දහම හඳුන්වා දුන්නේ සෝණ උත්තර දෙනම විසිනි. ඒ නිසා රජ මැදුර පවා හඳුන්වා ඇත්තේ **සෝණුත්තර** යන නාමයෙනි. එයින් කියවෙන්නේ රජ පවුල හා බුදුදහම අතර අරුති සම්පතාවයයි.
* බුරුමයේ බුදුදහම ව්‍යාප්තව ඇති කාලයේ ආසන්නතම රටක් වූ තායිලන්තයට ද අනවිරත රජු විසින් බුදුදහම හඳුන්වා දීමේ වැඩ පිළිවෙලක් සකස් කොට භික්ෂූන් පිරිසක් යවා ඇත. එම පිරිස ලංකාවට ද පැමිණ තායිලන්තයට ද වැඩම කළ බව කියවේ.
* තායිලන්තයේ රජු අනිවාර්යෙන්ම බෞද්ධයෙකු විය යුතුමය. රාජ්‍ය ආගමද බුදුදහම විය යුතුය. එසේම රජු බුදුදහමේ පෝෂණයට හා සංරක්ෂණයට කටයුතු කළ යුතුවේ. එහි විහාරස්ථාන නඩත්තු කිරීමත් රජු විසින් කර ඇත. මෙ සියලු කාරණා නිසාම තායිලන්තයේ බුදුදහම ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. තායිලන්තයේ බොහෝ ජනයා අනිවාර්යෙන්ම පැවිද්ද ලැබීමට සුදානම් වී තිබීමත් බුදුදහම ව්‍යාප්ත වීමට හේතුවක් වී ඇත.
* බුදුසමයේ බල පෑම නිසා තායිලන්ත ජන ජීවිතය වෙනස් වී ඇත්තේ මෙසේය.
* සියලුම පිරිමින් තාවකාලික හෝ පැවිදි වීම හා උපැවිදි වීම යන කාරනා දෙක උත්සවාකාරයෙන් එහි සිදු කර ඇත. එම පැවිදි වීම විවාහයේදීත්, රැකියාවේදීත්, රැකියා උසස්වීමවල දීත්, වැදගත් නිසා බොහෝ දෙනා පැවිදි වීම සිදු කර ඇත.
* විවාහ මංගල්ලය භික්ෂූන්ගේ ආශිර්වාද පිරිත් සජ්ඣායනාව මැද සිදු විය. එහි දී ආගමික වතාවත් සිදු කර ඇත. මංගල කටයුතුවල දී ආගමික වතාවත් නොකර එය සිදු කළේ නැත.
* තායිලන්ත විහාරස්ථාන අධ්‍යාපන මධ්‍යස්ථාන විය. එපමණක් නොව තවත් විවිධ වූ අවස්ථාවන් සඳහා එය භාවිතා කර ඇත. බොහෝ පූජා කටයුතු කරන තැනකි, එසේම බොහෝ දෙනා දින පතා පන්සලට ගොස් ආගමික වතාවත් කරන තැනක් ද විය. ආගමික කටයුතුවලින් බැහැරව කටයුතු කිරීමට ඇල්මක් නොදක්වන තත්ත්වයට තායි ජනයා පත්ව ඇත.
* මෙරට බුදුදහම රකින රජුට මල් පුදා අනතුරුව බුදුපිළිමයට මල් පිදීම ද සිදු කර ඇත.
* බුදුපිළිමයක් සියලුම දෙනා තම කරේ පැළඳවීමක් චාරිත්‍රයක් ලෙස සිදු කර ඇත. එසේම දිනපතා උදෙන්ම භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාත චාරිකාවේ යෙදෙයි, එහි දී බොහෝ දෙනෙක් මුලින්ම සිදු කරන්නේ පිණ්ඩපාතය බෙදන කාර්යයයි. ඉන් පසුවය තම කටයුතු ආරම්භ කරයි.
* අවමංගල කටයුතු හා ආදාහන කටයුතු විහාරස්ථානය තුළම සිදු කරනු ලබයි. එසේම මළ මිනිය තැන්පත් කරනු ලැබුවේ ද විහාරස්ථානයේම යි. මෙවැනි ජන ජීවිතය සමඟ බැදුණු චාරිත්‍ර සමූහයක් තායිලන්ත සමාජයෙන් දකින්නට හැකි විය.

8

බුදුන්වහන්සේ පිදීම උද්දේශික වන්දනාවකි. ත්‍රිවිධ චෛත්‍ය වැදීමේ දී හමුවන පිළිම වන්දනාව මෙයට අයත්ය. මුල් බෞද්ධයෝ ඒ කාලයේ පිළිම නිර්මාණයට කැමැත්තක් දක්වා නැත. ඒ ඔවුන් නොදන්නා කම නිසා නොව ශ්‍රද්ධාව නිසාය. බුදුන් කෙරෙහි ඇති කර ගත් අප්‍රමාණ වූ ගෞරවය නිසාය. ඒ බව අංගුත්තර නිකායේ දැක්වෙන පරිදි ඒක පුග්ගලෝ භික්ඛවේ. උප්පජ්ජමානෝ, උප්පජ්ජති, අදුතියෝ, අසහායෝ, අප්පටිමෝ, අප්පටිසමෝ, අප්පටිභාගෝ, අප්පටිපුග්ගලෝ, අසමෝ, අවසචත්වා, දීපදානං, අග්ගෝ, කථමෝ, ඒක පුද්ගලෝ, තථාගතෝ, අරහං සම්මා සම්බුද්දෝ, මහණෙනි, එක් පුද්ගලයෙක් මෙලොව උපදියි. ඔහු අද්වතීයයි, අප්‍රතිමය, අසහායයි, අප්‍රතිසමය, අප්‍රතිභාගය, අප්‍රතිපුද්ගලය, අසමය, අසමසමය, ඔහු නම් සම්මා සම්බුද්ධ වේ. මේ

නිසා මුල් කාලයේ ප්‍රතිමා නෙළීමට මිනිසා හුරු නොවන්නට ඇතැයි විශ්වාස කෙරේ. මෙ නිසා ඒ වෙනුවට විවිධ සංකේත භාවිතා කර ඇත. ඒ අතර මුල් කාලයේ බුදුන් පිදීම සඳහා භාවිතා කර ඇත්තේ බුදුන්වහන්සේගේ චරිතයත් එක්ක සම්බන්ධ වු යම් වස්තූන් කිහිපයකි.

* බෝධිය
* පද්මය
* ඡත්‍රය
* සිරිපතුල වේ. මේවාට ගෞරවය දක්වා ඇත්තේ බුදුන්වහන්සේට කරන උතුම් පූජාවක් වශයෙන්ය.
* බුදුපිළිම නෙළීමේ ගෞරවය මුලින්ම හිමිවන්නේ කණිෂ්ක රජතුමන්ටයි. විචාරකයෝ පවසන අන්දමට එතුමා විසින් සකසන කාසිවල බුදුරුව නෙලාතිබීම එයට හේතුවක් විය. පුරා විද්‍යාත්මක සාධක වලට අනුව බුදුරුව මානවාකාරයෙන් නෙලා ඇත්තේ ක්‍රි.පු පළමු වන සියවසේ හෝ ක්‍රි.ව පළමු වන සියවසේ හෝ කණිෂ්ක රජු සමයේ බව සඳහනක් ඇත. කණිෂ්ක රජු කිසවල වගේම පෙෂාවෝරයේ ඔහු විසින් සකසන ලද **ෂා-පි-කි-ඩෛරී** ධාතු කරඬුවේද බුද්ධ රූපයක් කැටයම් කර තිබුණි.

* කණිෂ්ක රජුගේ කාලයේ ප්‍රථම පිළිම නෙළීමේ ගෞරවය ගන්ධාර හා මතුරා සම්ප්‍රදායන්ට හිමිවන බව තවත් මතයක් වේ. මෙම සම්ප්‍රදායන් දෙකෙන් මුලින් ම නිර්මාණය කළේ කුමණ සම්ප්‍රදායේ ද යන්න පිළිබඳව දමතවාද ඇත. ඒ අතර වින්සසන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්, පුෂේ වැනි අය ප්‍රකාශ කර ඇත්තේ පළමු බුද්ධ ප්‍රතිමාව ගන්ධාරයේ සිදු වු බවයි. එසේම ආනන්ද කුමාර ස්වාමි සහ හැවල් ප්‍රකාශ කර ඇත්තේ ප්‍රථම පිළිමය නිර්මාණය කර ඇත්තේ මථුරාවේ බවයි.

* ප්‍රථම වරට බුදුපිළිම නෙළීම ආරම්භ කළේ කවර කලෙක කවරකු විසින් ද යන්න පිළිබදව විවිධ මත පවතී. ඒ මත අතර ප්‍රවාද, සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධක පදනම් ව ඇත.

* කෝසල බිම්බවණ්ණනාවට අනුව කොසොල් රජු විසින් සඳුන් ලීයෙන් ප්‍රථම පිළිමය නිර්මාණය කළ බව කිය වේ. ඒ නිසා එතුමා ප්‍රථම බුදුරුව නිර්මාණය කළ තැනැත්තා බවට පිළිගෙන ඇත. මෙය සාහිත්‍ය මූලාශ්‍රයක් වේ.

* කාලිංගබෝධි ජාතකයට අනුව අනේපිඩු සිටුතුමා බුද්ධ ප්‍රතිමාවක් නෙළීමට බුදු රදුන්ගෙන් අවසර ලබාගත් බව සඳහනක් ඇත.

* සමන්තපාසාදිකාවට අනුව අසෝක රජතුමා මහාකාල නම් නාගරාජයකු විසින් මවන ලද බුද්ධ ප්‍රතිමාවකට සත් දිනක් වැදුම් පිදුම් කර ඇත.

* විවිධ මූලාශ්‍රවලට අනුව ප්‍රථම පිළිම නිර්මාණය බුද්ධ කාලයේ දී සිද්ධ වු එකක් පවසා ඇත.

* බුදුපිළිම ක්‍රමානුකූලව වෙනස් වෙමින් පැමිණියේය. අනුරාධපුරය පොළොන්නරුව වැනි ස්ථානවලට මෙය එන විට වෙන වෙන ලක්ෂණවලින් ද යුක්ත විය. ආසියාතික රටවල පිළිම සමඟ ලාංකික පිළිම එක්කළ විට කුමණ සම්ප්‍රදායට අයත් ඒවාදැයි කිව නොහැකිය. ලංකාවේ පිළිමවල හුදකලා බවක් දකින්ට නැත. ඇත්තේ තවත් නිර්මාණත් සමග බැඳුණ ප්‍රතිමාවන්ය. අනුරාධපුරයේ ප්‍රතිමාවල ධ්‍යාන මුද්‍රාව හා අභය මුද්‍රාව දැක්වේ. එහෙත් භාරතීය පිළිමවල ඇතැම් ලක්ෂණ බැහැර කොට ඇත. සිරසවටා විහිදී ඇති රැස්වළල්ල එයින් එකකි. අනුරාධපුරයේ ප්‍රතිමාවල රැස්වළල්ල නැත, එහෙත් පළමුවරට පොළොන්නරුවේ එවැන්නක් නිර්මාණය කර ඇත.

* ii බෞද්ධ ගීත සාහිත්‍යයද වැදගත්ය. බුදු ගුණ පදනම් කොට ගෙන ඒවා නිර්මාණය කර ඇත. එයට උදාහරණ වශයෙන්

* අමාදහර දිය ගලා ගලා...
* බුද්ධං සරණං ගච්ඡාමි....
* සුගත ලෝනා සම්බුද්ධ රාජා....
* දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා.....


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

* අඩවන් වු දෙනෙතින් ගලනා.....
* දස බිම්බර මාර සෙනග.....
* පාරමිතා බල පුරිත පුජිත....
* සන්නාලියනේ....
* සංසාරේ බවේ දුකා......
* අඩු කුලේ කියාලා.....
* කවාලා විළඳ ජාති....
* සොර දෙටුවෙක් කස තැළුම් කකා.....

(24) WWW.PastPapers.WiKi (24)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!